**ප්‍රසම්පාදන දැන්වීමයි.**

**මීගමුව මහා නගර සභාව**

**<u>විවිධ අංශ වලින් ගබඩාව වෙත භාර දී ඇති පැරණි පුවත්පත් විකිණීම සඳහා ප්‍රාදේශීයව මිළ ගණන් කැඳවීම.</u>**

මීගමුව මහා නගර සභාවේ පුස්තකාල සහ කියවීම් ශාලාවලින් ඉවත් කරන ලද පුවත්පත් කි.ග්‍රෑ. අ842ක පමණ ප්‍රමාණයක් විකිණීම සඳහා මුද්‍රා තබන ලද පිටපත් දෙකකින් යුත් මිළ ගණන් කැඳවනු ලැබේ.

- බදු මුදල් රහිතව පත්තර කි.ග්‍රෑ. 01ක අවම මිළ - රු. 60.00
- ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තුව - රු. 5000.00
- ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝරම ගාස්තුව - **රු. 1500/-**
- ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීම - **2026.09.04** දින සිට **2026.09.11** දින ප. ව. **2.00** දක්වා
- ටෙන්ඩර් අයදුම්පත් භාර ගැනීම - **2026.09.11** දින ප. ව.**2.30** දක්වා
- ටෙන්ඩර් විවෘත කිරීම - **2026.09.11** දින ප. ව.**2.40** ට සිදු කෙරරේ

1. ඉහත අවම මිළට වැඩියෙන් ලැබෙන උපරිම මිළ ජයග්‍රාහි මිළ ලෙස පිළිගනු ලැබේ. ඊට අමතරව එම මුදලට රජයේ අනුමත බදු මුදල් ගෙවිය යුතුය.

2. සභාවෙන් නිකුත් කරනු ලබන ටෙන්ඩර් ආකෘති පත්‍ර නිසි පරිදි සම්පුර්ණ කර මුල් පිටපත හා දෙවන පිටපත වෙන වෙනම කවර වල බහා, මුද්‍රා තබා එම පිටපත් දෙකම එක් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''විවිධ අංශ වලින් ගබඩාව වෙත භාර දී ඇති පුවත්පත් සඳහා මිළ ගණන්'' යනුවෙන් සඳහන් කර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව යන ලිපිනයට **2026.09.11** දින පෙ.ව. **2.30** ට පෙර ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පැමිණ ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. නිසියාකාරව සම්පුර්ණ නොකරන ලද හෝ ප්‍රමාද වී ලැබෙන හෝ සභාවේ අවම ටෙන්ඩර් මුදලට අඩුවෙන් මිළ ගණන් ඉදිරිපත් කරන ලද හෝ නාගරික කොමසාරිස් විසින් පිළිගත නොහැකි යැයි තීරණය කරනු ලබන හෝ ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මිළ ගණන්, මකන දියර භාවිතා කර වෙනස් කිරීම නොකළ යුතුය. මිළ ගණන් සංශෝධනය කිරීම අවශ්‍යය වන්නේ නම්, තනි ඉරකින් කපා හැර අළුත් මිළ ගණන් සඳහන් කර ඒ ආසන්නයේ අයදුම්කරුගේ සම්පුර්ණ අත්සන තැබිය යුතුය. එසේ නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. විකිණීමට තබා ඇති භාවිතයෙන් ඉවත් කළ පුවත්පත් **2026.09.04** දින සිට කාර්යාලීය වේලාවන් තුල ගබඩා අංශයට පැමිණ පරීක්ෂා කර බැලිය හැකිය.

5. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවට ටෙන්ඩර්කරුට හෝ ටෙන්ඩර්කරුගේ ලිඛිත අවසරය ඇති එක් අයෙකුට සහභාගි විය හැකිය.

6. ජයග්‍රාහී ටෙන්ඩර්කරු අදාළ මුදල ගෙවන ලෙස දැනුම් දෙනු ලබන දිනට පැමිණ සම්පුර්ණ මුදල් එකවර ගෙවිය යුතුය. ඒ සමගම පත්තර තොගය ගබඩාවෙන් ඉවත් කර ගත යුතුය.

7. මෙම ටෙන්ඩරය සම්බන්ධව සභාව විසින් ගන්නා වු තීරණය අවසාන තීරණය වේ.

නාගරික කොමසාරිස්,
මහා නගර සභාව,
මීගමුව.